සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/ All rights Reserved]

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2024
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2024

කෘෂි විද්‍යාව I
விவசாய விஞ்ஞானம் I
Agricultural Science I

08 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවට ආවේණික ශාක ප්‍රජාව ආරක්ෂා කර ගැනීමේ අරමුණින් 1999 පැළෑටි සංරක්ෂණ පනත ඉදිරිපත් කර ඇති අතර මෙම පනත යටතේ බලය ලත් නිලධාරියා වනුයේ,

(1) මධ්‍යම පරිසර අධිකාරියේ අධිකාරිවරයා ය.
(2) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා ය.
(3) කෘෂිකර්ම අධ්‍යක්ෂක ජනරාල්වරයා ය.
(4) වාරිමාර්ග ජල හා ආපදා අධ්‍යක්ෂවරයා ය.
(5) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා ය

02. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙනුයේ,

(1) අන්තර් මෝසම I
(2) අන්තර් මෝසම II
(3) නිරිත දිග මෝසම් වැසි
(4) ඊසාන දිග මෝසම් වැසි
(5) වාසුළි වැසි

03. බීජවල ජීව්‍යතාවය පිරික්සීමට විවිධ ක්‍රම භාවිතා කරයි. ටෙට්‍රාසෝලියම් පරීක්ෂාවේදී,

(1) ජීවී බීජ රතු පැහැයෙන් වර්ණ ගැන්වේ.
(2) ජීවී බීජ කහ පැහැයෙන් වර්ණ ගැන්වේ.
(3) ජීවී බීජ නිල් පැහැයෙන් වර්ණ ගැන්වේ.
(4) අජීවී බීජ කහ පැහැයෙන් වර්ණ ගැන්වේ.
(5) අජීවී බීජ රතු පැහැයෙන් වර්ණ ගැන්වේ.

04. පහත දැක්වෙන ප්‍රචාරක ව්‍යුහවලට ගැලපෙන උදාහරණ නිවැරදි අනුපිළිවෙලින් දක්වා ඇත්තේ,





(1) ගහල, හබරල, සුදුළූණු
(2) ඉඟුරු, ඔකිඩ්, ටියුලිප්
(3) හබරල, ටියුලිප්, ගෝනිගස්
(4) ඉඟුරු, රතුළූණු, ලිලී
(5) මිංචි, නුග, ලීක්ස්

05. මඩ කරන ලද පසක් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A දෘෂ්‍ය ඝනත්වය වැඩිවේ.

B දෘෂ්‍ය ඝනත්වය අඩුවේ.

C පස මතුපිට අහඹු රළු බව වැඩි වේ.

ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A පමණි (2) B පමණි

(3) A හා C පමණි (4) A හා B පමණි

(5) B හා C පමණි

06. ප්ලෝයම පටකය තුළින් පරිසංක්‍රමණය සිදුවන බව නිරීක්ෂණය කළ හැකි අවස්ථාවක් වන්නේ,

(1) ජල ඌණතාවයක දී ශාක මැලවීම

(2) වා සිදුරු ඇතිවීම

(3) පොතු වළලු අසල අධිවර්ධනය වීම

(4) පළිබෝධ හානි කළ ශාක කඳේ ස්ථාන නැවත සුව වීම

(5) ශාක කහ පාට වීම

07. පහත දැක්වෙන ශාක පෝෂක අතුරින් ශක්ති හුවමාරුවට වඩා වැදගත් වන ශාක පෝෂකය වනුයේ,

(1) නයිට්‍රජන් (2) පොස්පරස් (3)කොපර් (4) හයිඩ්‍රජන් (5) මොලිබ්ඩිනම්

08. පහත රූපසටහනේ දැක්වෙන්නේ පසක වර්ණය නිර්ණය කරන මන්සල් වර්ණ සටහනක කොටසකි. එහි A ලෙස සඳහන් ස්ථානයේ පාංශු වර්ණය නිවැරදිව දැක්වෙන්නේ,



(1) 2.5Y4/7

(2) 4/7 2.5Y

(3) 2.5Y 7/4

(4) 7/4 2.5Y

(5) 2.5YR 7/4

09. පාෂාණ ජීරණයේ මුල්ම අවස්ථාව වන්නේ,

(1) පාෂාණය මතුපිට පතුරු ගැලවී යාම.
(2) පාෂාණයේ මතුපිට ඔක්සිකරණය වී මෘදු වීම.
(3) පාෂාණය මතුපිට පාසි හා ලයිකන වර්ධනය
(4) පාෂාණයේ ඇති ඛණිජ අම්ල වල දියවීම
(5) පාෂාණයේ පැලුම් අතරින් ශාක මුල් ගමන් කිරීම

10. පාංශු ජනනයේ දී පසට කාබනික ද්‍රව්‍ය එකතු වීම පිළිබඳව වක්‍ර ආකාරයෙන් බලපාන සාධකය වන්නේ,

(1) වර්ෂණය
(2) වර්ෂාපතන තිව්‍රතාවය
(2) බෑවුම
(4) භූමිය මුහුණ ලා ඇති දිශාව
(5) කාලය

11. පස්වල බාදනය වීමේ හැකියාව අඩු වන්නේ,

(1) ඇතුළු කාන්දුව අඩු වී මතුපිට අපධාවය වැඩිවන විට
(2) දුර්වල ව්‍යුහයක් සහිත පසක් ඇතිවිට
(3) පසෙහි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අඩුවිට
(4) පාංශු වයනය වැලිමය ලෝම හෝ ලෝම වයනයක් ඇති විටය
(5) පාංශු වයනය රොන්මඩ හෝ මැටි සහිත වයනයක් ඇති විටය

12. බෝගවල පසු අස්වනු ගුණාත්මය ආරක්ෂා කර ගැනීම සඳහා,

(1) අස්වනු නෙළීමෙන් පසු අඹ, ගස් ලබු සිසිල් ජලයෙන් සේදීම.
(2) අලිපේර අස්වනු නෙලීම සඳහා අධික හිරු රැස් ඇති දහවලක් යොදා ගැනීම.
(3) අඹ හා පැපොල් අස්වනු ඇසිරීම සඳහා දැල් බෑග් යොදා ගැනීම.
(4) පළතුරු බෝග අස්වනු වල ගබඩා උෂ්ණත්වය වැඩි කිරීම.
(5) අස්වනු නෙළීමෙන් පසු හිරු එළියට නිරාවරණය නොවන ලෙස ඇසිරීම.

13. පහත දැක්වෙන බද්ධ ක්‍රම අතරින් රිකිලි බද්ධ ක්‍රමය/ ක්‍රම වන්නේ,

A කුඤ්ඤ බද්ධය

B හරිත බද්ධය

C ජිහ්වා බද්ධය

(1) A පමණි
(2) B පමණි
(3)A හා B පමණි
(4) A හා C පමණි
(5) A,B,C සියල්ලම

14. පහත දැක්වෙන සංසිද්ධීන් අතරින් පරපරාගනය සඳහා ස්වභාවධර්මය විසින් නිර්මිත හැඩගැසීමක් වනුයේ,

(1) පුෂ්ප පිපෙන්නට පෙර පරාග කණිකා එම පුෂ්පයේ කලංක මත පතිතවීම.
(2) පරාගධානි විවෘත වීම හා කලංක ග්‍රාහීවීම අවස්ථා දෙකක දී සිදු වීම.
(3) පුෂ්ප විවෘත වීමෙන් පසුව ද රේණු හා කලංකය පුෂ්පයේ අනෙක් කොටස් අතර සඟවී පැවතීම.
(4) පරාගධානි විවෘත වීම හා සමගාමීව කලංකය පරාගධානිවල වැදෙන සේ දිගුවීම.
(5) ද්විලිංගික පුෂ්ප ඇති වීම.

15. පහත සඳහන් පොහොර වර්ග අතුරින් දීර්ඝ කාලීනව පසට යෙදීම මඟින් පස ආම්ලික වීමට හේතු වනුයේ,

(1) සිංගල් සුපර් පොස්පේට්
(2) එප්පාවල ඇපටයිට්
(3) කැල්සියම් සයනමයිඩ්
(4) කැල්සියම් නයිට්‍රේට්
(5) ඇමෝනියම් පොස්පේට්

16. අමිශ්‍ර පොහොරවල වාසි ලෙස ශිෂ්‍යයෙකු පහත කරුණු දක්වා තිබුණි.

A. අමිශ්‍ර පොහොර යෙදීමේ වියදම අඩුය.

B. පොහොර අපතේ යාම අඩුය.

C. පසේ පෝෂක අසමතුළිතතාවයක් ඇති නොකරයි.

මෙම ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A පමණි
(2) B පමණි
(3) A හා C පමණි
(4) A හා B පමණි
(5) A,B හා C පමණි

17. විසංයෝගිත බීජ යනු,

(1) සරු කළලයක් සහිත බීජයකි.
(2) නිසරු කළලයක් සහිත බීජයකි.
(3) කළල කිහිපයක් සහිත බීජයකි.
(4) කළලයක් රහිත බීජයකි.
(5) සරු හා නිසරු කළල සහිත බීජයකි.

18. ශාක මුලෙහි ජලය අරියව ගමන් කළ නොහැකි පටකය වන්නේ,

(1) බාහිකය
(2) අන්තශ්චර්මය
(3) පරිචක්‍රය
(4) කැස්පාර් පටිය
(5) මූල කේෂය

19. ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය (DFT) පිළිබඳව වඩාත් නිවැරදි වන්නේ,

(1) මෙම ක්‍රමයේදී pvc නළ සම්පූර්ණයෙන්ම පෝෂක ද්‍රාවණයෙන් පුරවයි.

(2) පෝෂක ද්‍රාවණය ජල පොම්පයක් මඟින් ප්‍රතිචක්‍රණය කරයි.

(3) සියළුම එළවළු බෝග සඳහා මෙම ක්‍රමය උචිතයි.

(4) පැළ සිටවන කුඩා දැල් බඳුනේ කාබනික ද්‍රව්‍ය පුරවයි.

(5) පෝෂක ද්‍රාවණය වරින් වර අලුත් කිරීම අනවශ්‍යයි.

20. තාවකාලික ප්‍රචාරක ව්‍යුහ ආකාරයක් රූපසටහනේ දැක්වේ. එම ක්‍රමය පිළිබඳව වඩාත් නිවැරදි වන්නේ,

(1) බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය අවම අගයක පවතී.

(2) කුඩා බීජ පැළවල උත්ස්වේදන වාෂ්පීකරණය වැඩිවී දිවා කාලයේ දී මැළවේ.

(3) පසේ ජීවත්වන මහා පළිබෝධකයින්ගෙන් ශාකයට හානි පැමිණේ.

(4) ක්ෂුද්‍ර පරිසරයේ උෂ්ණත්වය, ආර්ද්‍රතාවය වැඩි බැවින් බීජ පැළයේ වර්ධන වේගය වැඩි වේ.

(5) පාරදෘෂ්‍ය පොලිතීනය නිසා බීජ පැළයට ලැබෙන ආලෝක ප්‍රමාණය සීමාකාරී වේ.

CS CamScanner

21. පහත රූපවල දැක්වෙන රෝග ලක්ෂණ සඳහා රෝග කාරක වන්නේ පිළිවෙලින්,



(1) දිලීර, පයිටොප්ලාස්මා, වෛරස්

(2) දිලීර, වෛරස්, බැක්ටීරියා

(3) බැක්ටීරියා, වෛරස්, දිලීර

(4) පයිටොප්ලාස්මා, වෛරස්, දිලීර

(5) පයිටොප්ලාස්මා, දිලීර, වෛරස්

22. රූපයේ දැක්වෙන්නේ දියර ඉසින යන්ත්‍රයකි. එහි දියර විසර්ජනය වන වේගය පාලනය කළ හැකි උපාංගය වන්නේ,



(1) a

(2) g

(3) h

(4) c

(5) i

23. ශිෂ්‍යයෙකු විසින් පළිබෝධකයෙකු පිළිබඳව පහත ලක්ෂණ ලැයිස්තු ගත කරන ලදී.

පූර්ව පියාපත් යුගල ඒකාකාරීව ඝනවී ඇත.

අසම්පූර්ණ රූපාන්තරණයක් පෙන්වයි.

හපන හා විකන මුඛ උපාංග ඇත.

ඉහත ලක්ෂණ දරන කෘමි පළිබෝධකයා විය හැක්කේ,

(1) කහ පුරුක් පණුවා

(2) සුදු මැස්සා

(3) පතංගයා

(4) කෙසෙල් කඳ ගුල්ලා

(5) ගොයම් මකුණා

24. පහත දැක්වෙන්නේ ආගන්තුක ආක්‍රමණකාරි වල් පැළෑටි කිහිපයකි. ඒවා අතුරින් විසිතුරු ශාක ලෙස මෙරටට ආනයනය කරන ලදැයි සැලකෙන පැළෑටිය වන්නේ,

(1) *Lantana camera*

(2) *Alstonia macrophylla*

(3) *Mimosa pigra*

(4) *Parthenium hyterophorus*

(5) *Annona glabra*

25. පාසල් සිසුන් පිරිසක් පොලිතින් ගෘහයක් තුළ නොගැඹුරු පෝෂණ ද්‍රාවණ පටල තාක්ෂණය (NFT) යොදාගෙන සලාද පැල සිටුවීමට සැලසුම් කරන ලදී. කුඩා සලාද පැල සකසා ගැනීම සඳහා භාවිතා කළ හැකි තවාන් වර්ගය වන්නේ,

(1) තැටි තවාන්

(2) නොරිදෝකෝ තවාන්

(3) ස්පොන්ජ් තවාන්

(4) බඳුන් තවාන්

(5) වැලි තවාන්

CamScanner

26. ශාක අභිජනන ක්‍රියාවලියකදී පහත සඳහන් ප්‍රවේණි දර්ශ සහිත ශාක දෙකක් මුහුම් කරන ලදී.

උස ලක්ෂණය (T) මිටි ලක්ෂණය (t)ට ප්‍රමුඛ වන අතර කොළ ලක්ෂණය (G), කහ ලක්ෂණය (g) ට ප්‍රමුඛ වේ. එවිට TTGg x Ttgg මුහුමෙන් ලැබුණු F_1 පරම්පරාවේ උස කොළ රූපානුදර්ශ ප්‍රතිශතය වන්නේ,

(1) 100% (2) 75% (3) 50% (4) 25% (5) 12.5%

27. ක්ෂීරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය හා ව්‍යුහය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගර්ත කුහරය මඟින් මයෝඅපිච්ඡදය වෙත කිරි ස්‍රාවය වේ.

(2) ගර්ථික ග්‍රන්ථිවල බාහිර ස්ථරය මයෝඅපිච්ඡදය වේ.

(3) ක්ෂීර ග්‍රන්ථියක කණ්ඩිකා විශාල ප්‍රමාණයක් අඩංගු වේ.

(4) කණ්ඩිකා වල සිට රැගෙන එන ක්ෂීරය මයෝඅපිච්ඡදයට ඇතුළු වේ.

(5) ක්ෂීර ග්‍රන්ථි පටක එකිනෙක සම්බන්ධ කිරීම මයෝඅපිච්ඡදයේ කාර්යය වේ.

28. ශ්‍රී ලංකාවේ වැඩිම දේශීය ගව ගහනය වාර්තා වන දිස්ත්‍රික්කය වන්නේ,

(1) යාපනය (2) අනුරාධපුර (3) අම්පාර

(4) මඩකලපුව (5) හම්බන්තොට

29. පහත දැක්වෙන ගොවිපළ සතුන් අතරින් ඉහළම ශරීර උෂ්ණත්වය දරන සත්ත්ව කාණ්ඩය වන්නේ,

(1) ගවයා (2) ඌරා (3) බැටළුවා (4) එළුවා (5) කුකුළා

30. පහත සත්ත්ව රෝග අතරින් පරිවෘත්තීය ක්‍රියාවලිවල අසාමාන්‍යතා නිසා ඇතිවන රෝග පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) කිරි උණ, උද්ගාරය, කීටෝසියාව

(2) කිරි උණ, ඇනකොටාගැනීම, කකුල් කොරවීම

(3) උද්ගාරය, කීටෝසියාව, මැස්ටයිටිස්

(4) මැස්ටයිටිස්, කිරි උණ, කිනිතුළු උණ

(5) කිරි උණ, කීටෝසියාව, බ්‍රොන්කයිටිස්

31. බ්‍රොයිලර් සතුන්ගේ ආහාර පරිවර්තන කාර්යක්ෂමතාවය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

පරිභෝජනය කළ ආහාර ප්‍රමාණය = xkg

සතුන්ගේ ශරීර බරවල එකතුව = ykg

(1) $\frac{x}{y} \times 100\%$ (2) $\frac{x-y}{y} \times 100\%$ (3) $\frac{y}{x} \times 100 \times 100$

(4) $\frac{y-x}{x} \times 100\%$ (5) $\frac{x+y}{y} \times 100\%$

32. පහතින් දැක්වෙන්නේ ගවයාගේ රූමනය පිළිබඳ ප්‍රකාශ දෙකකි.

A. රූමනය තුළ pH අගය 5.5-6.5 අතර වේ.

B. රූමන තරලයේ බැක්ටීරියා අති විශාල ප්‍රමාණයක් අන්තර්ගත වේ.

(1) A පමණක් නිවැරදි වේ.

(2) B පමණක් නිවැරදි වේ.

(3) A හා B නිවැරදි අතර A මඟින් B පැහැදිලි කරයි.

(4) A හා B නිවැරදි අතර B මඟින් A පැහැදිලි කරයි.

(5) A හා B නිවැරදි නමුත් ඒ අතර සම්බන්ධයක් නොමැත.

CS CamScanner

33. පහත රූප සටහන මඟින් වසු පැටවෙකුගේ ආමාශයේ ව්‍යුහය දැක්වේ. එහි A,B,C,D අක්ෂර මඟින් දක්වා ඇත්තේ පිළිවෙලින්,



(1) රූමනය, බහුනැමිය, විතංශිකාව, ජඨරාශය

(2) විතංශිකාව, රූමනය, බහුනැමිය, ජඨරාශය

(3) ජඨරාශය, රූමනය, බහුනැමිය, විතංශිකාව

(4) බහුනැමිය, රූමනය, ජඨරාශය, විතංශිකාව

(5) රූමනය, විතංශිකාව, බහුනැමිය, ජඨරාශය

34. ආහාර නරක්වීම කෙරෙහි බහුල ලෙස බලපාන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වනුයේ,

(1) බැක්ටීරියා,වෛරස්

(2) වෛරස්, දිලීර

(3) බැක්ටීරියා, ප්‍රොටොසෝවා

(4) බැක්ටීරියා, දිලීර

(5) වෛරස්, ප්‍රොටොසෝවා

35. කෘෂි විද්‍යාව විෂය හදාරණ සිසුන් පිරිසකට කෙසෙල් වල පරිණත බව සෙවීමට අවශ්‍ය සාධක අතුරින් භෞතික හා රසායනික සාධක මැන ගැනීමට අවශ්‍ය වූයේ නම් ඒ සඳහා ඔවුන් භාවිතා කළ යුතු උපකරණ පිළිවෙලින්,

(1) ව'නියර් කැලිපරය, ඈඩතා මීටරය

(2) වර්ණ සටහන, බ්‍රික්ස් මීටරය

(3) pH මීටරය, ව'නියර් කැලිපරය

(4) බ්‍රික්ස් මීටරය, ඈඩතා මීටරය

(5) ඈඩතා මීටරය, වර්ණ සටහන

36. ආහාර හා පෝෂණය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) සත්ත්ව සම්භවයක් ඇති ආහාරවල ජීරකතාව ශාකමය සම්භවයක් ඇති ආහාරවල ජීරකතාවට වඩා වැඩිය.

(2) ආහාරවල ප්‍රතිඔක්සිකාරක එකතු කිරීමෙන් එන්සයිම ක්‍රියාකාරිත්වය හා පෝෂක හානිය වළක්වා ගත හැකිය.

(3) ලෝරික් අම්ලය මිනිසාට ඉතාමත් අත්‍යාවශ්‍ය මේද අම්ලයකි.

(4) සංතෘප්ත මේද අම්ල සත්ත්ව මේදයේ පමණක් අඩංගු වේ.

(5) කිරි මේදය, මිනිස් සිරුර තුළ අහිතකර කොලෙස්ටරෝල් නිපදවීම සිදු නොකරයි.

37. නිෂ්පාදන සාධක සඳහා ආවස්ථික පිරිවැයක් දැරීමට සිදුවන්නේ ඒවා,

(1) නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය නිසා.

(2) පිරිවැයක් දැරීමට සිදුවන නිසා

(3) සාපේක්ෂව හිඟ නිසා

(4) විකල්ප ප්‍රයෝජන ඇති නිසා

(5) කාර්යක්ෂමව භාවිතා කළ යුතු නිසා

CamScanner

38. ඉල්ලුම් වක්‍රයක් දකුණට විතැන්වීමට බලපාන සාධකයක් වන්නේ,

(1) එම භාණ්ඩයේ මිල වැඩි වීම.

(2) එම භාණ්ඩයේ මිල අඩු වීම.

(3) භාණ්ඩය කෙරෙහි පාරිභෝගික රුචිය අඩුවීම.

(4) එම භාණ්ඩයට ඇති ආදේශක භාණ්ඩවල මිල අඩු වීම.

(5) එම භාණ්ඩයට ඇති ආදේශක භාණ්ඩවල මිල වැඩි වීම.

39. රජය විසින් අර්තාපල් හා ලොකුළුණු සඳහා පැවති ආනයන බද්ද ඉහළ දැමීමට ප්‍රධාන අරමුණ වන්නේ,

(1) අර්තාපල් හා ලොකුළුණු ආනයන කරුවන් ආරක්ෂාකර ගැනීම.

(2) දේශීය අර්තාපල් හා ලොකුළුණු නිෂ්පාදකයින් ආරක්ෂා කර ගැනීම.

(3) පාරිභෝගිකයාට ඉහළ ගුණාත්මක කෘෂි නිෂ්පාදන ලබා දීම.

(4) වෙළඳපලේ අර්තාපල් හා ලොකුළුණු සැපයුම වැඩි කිරීම.

(5) වෙළඳපලේ අර්තාපල් හා ලොකුළුණු ඉල්ලුම වැඩි කිරීම.

40. දේශීය වෙළඳපලේ බිත්තර මිල උච්චාවචනයට සම්බන්ධ ප්‍රකාශ කිහියයක් පහත දැක්වේ.

A බිත්තර සැපයුම ඉහළ යාම

B බිත්තර ඉල්ලුම අඩු වීම

C කුකුළු කෑම වල මිල වැඩි වීම

ඉහත හේතු අතුරින් බිත්තරයක මිල අඩු වීමට බලපාන්නේ,

(1) A පමණි (2) B පමණි (3) C පමණි

(4) A හා B පමණි (5) A හා C පමණි

41.

නිමැවුම් ඒකක ගණන	1	2	3	4	5	6
මුළු වියදම	12	15	19	24	28	30

මෙම ව්‍යාපාරයේ නිමැවුම් ඒකක 4 සහ 5 අතර දී ආන්තික පිරිවැය වන්නේ,

(1) 5 (2) 2 (3) 3 (4) 4 (5) -4

42. මූල කලාපයේ ගැඹුර 50cmක් වන බෝග වගා ක්ෂේත්‍රයක දෘෂ්‍ය ඝනත්වය $1.4gcm^{-3}$ වේ. ජල සම්පාදනය කරන අවස්ථාවේ හා ක්ෂේත්‍ර ධාරිතාවය අවස්ථාවේ දී භාරමිතික ජල ප්‍රතිශත පිළිවෙලින් 12% හා 26% ක්ද නම් ශුද්ධ ජල අවශ්‍යතාවය වන්නේ,

(1) $4.5cm^3$ (2) $6.8\ cm^3$ (3) $9.8\ cm^3$

(4) $18\ cm^3$ (5) $25\ cm^3$

CS CamScanner

43. තිරසර කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ,

A තිරසර කෘෂිකර්මාන්තය කාබනික ගොවිතැන හා සමාන වේ.

B පාරිසරික සෞඛ්‍ය ආරක්ෂා කිරීම එහි ප්‍රධාන අරමුණයි.

C තිරසර කෘෂිකර්මාන්තයේ දී රසායනික පළිබෝධනාශක භාවිතා නොකරයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

(1) A පමණි
(2) B පමණි
(3) C පමණි
(4) A හා B පමණි
(5) B හා C පමණි

44. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක් සම්බන්ධව ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A සාමාන්‍ය කාලගුණික මධ්‍යස්ථානයකට වඩා අනිල මානය හා සුළං දිශා දර්ශකය අඩු උසකින් පිහිටුවා ඇත.

B කෘෂි බෝග සඳහා පාරිසරික බලපෑම් ඇති කරන්නේ මීටර දෙකකට වඩා අඩු වායුගෝලීය ස්ථර වේ.

මෙම ප්‍රකාශ අතරින්,

(1) A පමණක් සත්‍ය වේ.

(2) B පමණක් සත්‍ය වේ.

(3) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර A මගින් B පැහැදිලි කරයි.

(4) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර B මගින් A පැහැදිලි කරයි.

(5) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර ඒවා අතර සම්බන්ධතාවයක් නැත.

45. අධික වර්ෂාපතනයත් සමග ජල වහන පද්ධති අවහිර වීමෙන් විවිධ රෝග ව්‍යාප්ත වේ. පසුගිය කාලයේ තෙත් බිම් ආශ්‍රිතව සෞඛ්‍ය ගැටළුවක් බවට පත්වූ රෝගය සහ රෝග කාරකයා නිවැරදිව දැක්වෙන්නේ,

(1) මී උණ — *Leptospira spp.*

(2) ඩෙංගු — *Aedes aegypti*

(3) බෲසෙල්ලෝසිස් — *Mycobactirium tuberculosis*

(4) සිපිලිස් — *Brucella abotus*

(5) ක්ෂය රෝගය — *Leptospira interrogans*

46. බීජ ඒකාධිකාරය හා ජාන විකරණය කරනලද ආහාර සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) බීජ ඒකාධිකාරය ඇති වීම තුළින් බීජ මිල අඩුවිය හැකිය.

(2) බීජ ඒකාධිකාරය නිසා දේශීය ජාන සම්පත් ආරක්ෂා වේ.

(3) ජාන විකරණය කළ ආහාර නිෂ්පාදනයට ජීවීන් භාවිතා කරයි.

(4) ජාන විකරණය කළ ආහාර මානව සෞඛ්‍යට හිතකර බව තහවුරු වී ඇත.

(5) ඇපල් ජාන විකරණය කර නිපදවන ලද පළතුරකට උදාහරණයකි.

47. වියළි කලාපයේ ටී.ජේ.සී. (TJC) අඹ වගාවක් සඳහා වඩාත් සුදුසු වාරි තාක්ෂණ ක්‍රමය වන්නේ,

(1) පිටාර ජල සම්පාදනය
(2) බුබුළු ජල සම්පාදනය
(3) බිංදු ජල සම්පාදනය
(4) කළගෙඩි ජල සම්පාදනය
(5) වළලු ජල සම්පාදනය

48. විස්ථාපන පොම්පවලට සාපේක්ෂව කේන්ද්‍රාපසාරී පොම්පවල,

(1) ශක්තිමත්බව හා කල් පැවැත්ම වැඩිය.

(2) ඉන්ධන සඳහා වියදමක් නැත.

(3) ජලය විසර්ජනය ඒකාකාරීව සිදු වේ.

(4) අපද්‍රව්‍ය සහිත ජලය පොම්ප කළ නොහැකිය.

(5) මූලික වියදම වැඩිය.

49. කෘමිනාශක වල ධූලකතාව පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A LD_{50} අගය යනු දේහ බර 1kg සඳහා අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය ග්‍රෑම් (g) ප්‍රමාණය යි.

B විෂ අඩු පළිබෝධනාශක ලේබලයේ තද නිල් පාට තීරුවක් ඇත.

C 1A හා 1B කාණ්ඩවලට අයත් පළිබෝධනාශක උග්‍ර විෂ සහිතය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ,

(1) A පමණි

(2) B පමණි

(3) C පමණි

(4) A හා B පමණි

(5) B හා C පමණි

50. ජෛවගතික ගොවිතැන පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A ජෛවගතික ගොවිතැනේ දී කාබනික පොහොර භාවිතය පමණක් සිදුවේ.

B හෝමියෝපති ද්‍රාවණ පසට එකතු කරමින් වගා කටයුතු සිදුකරයි.

C කාබනික ගොවිතැන හා සමාන නොවේ.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,

(1) A පමණි

(2) B පමණි

(3) C පමණි

(4) A හා B පමණි

(5) B හා C පමණි